(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 7(1).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2017 අගෝස්තු මස 25 වැනි සිකුරාදා**

## 2017 සැප්තැම්බර් මස 06 වැනි බදාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— උදර්පන පනත යටතේ නියමය (අංක 1),— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජන චීන සමූහාණ්ඩුව අතර උදර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජුනි 20 දිනැති අංක 2024/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.08.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— උදර්පන පනත යටතේ නියමය (අංක 2),— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ වියට්නාම සමාජවාදී ජනරජය අතර උදර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජුලි 19 දිනැති අංක 2028/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජුනි 09 දිනැති අංක 2022/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.08.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 19 දිනැති අංක 2024/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.08.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) නියමය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 11 දිනැති අංක 2027/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.08.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු, 142 වගන්තියේ (2) උපවගන්තියේ (ද) ඡේදය යටතේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 14 දිනැති අංක 2023/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.08.22 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2014),— 2007 අංක 7 දරන සමාගම් පනත සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනත අනුව 2017.03.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද කේපීඑම්ජී ආයතනයේ වරලත් ගණකාධිකාරීන්ගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2014),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.05.05 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2014),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.09.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් මහජන බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2014),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.05.05 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.11.15 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් සී/ස හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.10.28 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2017 නොවැම්බර් මස 13 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

134/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.01.01 දින සිට 2015.06.30 දින දක්වා කාලය තුළ අත්අඩංගුවට ගනු ලැබූ නීතිවිරෝධී ලෙස මෙරටට ගෙනෙන ලද දුම්වැටිවල වටිනාකම කොපමණද;

(ii) එම දුම්වැටි සමඟ අත්අඩංගුවට ගෙන වැරදිකරුවන් වූ අයගේ නම්, ලිපින, දුරකථන අංක හා විදේශිකයෙක් නම් රට කවරේද;

(iii) ඉහත (ii) හි සඳහන් පුද්ගලයන්ට දුන් දඬුවම් එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) අත්අඩංගුවට ගන්නා නීතිවිරෝධී දුම්වැටි නීතිමය ක්‍රියාමාර්ගයන්ගෙන් පසු විනාශ කරන්නේද;

(ii) එසේ නම්, දුම්වැටි විනාශ කිරීමේ ක්‍රියාපිළිවෙළ කවරේද;

(iii) නොඑසේ නම්, එම දුම්වැටි රජයේ බදුවලට යටත්ව වෙළඳ පොළට නිකුත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

931/'16

ගරු වන්දිම ගමගේ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කළයුතු බව විදුලිබල පනතේ සඳහන්ව ඇති බව දන්නේද;

(ii) මේ වනතෙක් සිදු කර ඇති විදුලිය මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවර අවස්ථාවලදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

991/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපතිවරයන් හෝ සම සභාපතිවරයන් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන පුද්ගලයන් පත් කර තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ ඔවුන් සභාපතිත්වය දරන ප්‍රාදේශීය සංවර්ධන කමිටු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සභාපතිවරයන් සතු බලතල කවරේද;

(iv) එම පුද්ගලයන් එකී තනතුරුවලට පත් කිරීමේ පදනම කවරේද;

(v) එම පුද්ගලයන්ගේ ඉහළම අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එකී සභාපතිවරයන්ට/සම සභාපතිවරයන්ට ලබා දෙන වැටුප්, දීමනා සහ වෙනත් පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1113/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2010 සිට 2016 වර්ෂය දක්වා බදුල්ල දිස්ත්‍රික්කය තුළ,

(i) ලබා දුන් ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර සංඛ්‍යාව කවරේද;

(ii) එම බලපත්‍ර ලබාගත් පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම බලපත්‍ර ලබාදීම තුළින් වාර්ෂිකව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබුණු ආදායම් ප්‍රමාණය කවරේද;

(iv) ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේදී සලකා බලන නිර්ණායක කවරේද;

(v) මෙසේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේදී යම් වංචා, දූෂණ සිදුවී ඇත්නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1191/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1983 වර්ෂය වනවිට පුත්තලම දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේ යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1298/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, ජාතික සහ පළාත් පාසල්වල සේවය කරන අනධ්‍යන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික සහ පළාත් පාසල්වල පවතින අනුමත අනධ්‍යන සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු සංඛ්‍යාව, ජාතික සහ පළාත් පාසල් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පියවර ගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා අදාළ වන බඳවා ගැනීමේ පටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1381/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැයෙහි අංක 149 යෝජනාවට අනුව, අනුරාධපුර, වව්නියා සහ කිළිනොච්චි දිස්ත්‍රික්කයන්හි කෘෂි හා පශු සම්පත් මත්ස්‍ය සැකසුම් කලාපයන් පිහිටුවීමට රුපියල් මිලියන 100ක් වෙන් කළ බව පිළිගන්නේද;

(ii) මෙම ව්‍යාපෘති තුන සඳහා ශක්‍යතා වාර්තා පිළියෙළ කරනු ලැබුවේ කවුරුන් විසින්ද;

(iii) ඒ අනුව, මෙකී ව්‍යාපෘති තුන සඳහා ඇස්තමේන්තු කළ මුළු පිරිවැය කොපමණද;

(iv) මෙකී ව්‍යාපෘති තුන සඳහා, 2016 වර්ෂාවසානය වනවිට මහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

(v) 2017 වර්ෂයට ඉහත ව්‍යාපෘති වෙනුවෙන් ලබා දිය හැකි මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1466/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ තුළ පදිංචි අඩු ආදායම්ලාභී පවුල් සඳහා මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදල්වලින් නොමිලේ සෙවිලි තහඩු බෙදා දුන් බව පිළිගන්නේද;

(ii) විමධ්‍යගත අරමුදල් යොදාගනිමින් මන්ත්‍රීවරයන් විසින් සිදු කරනු ලැබූ සෙවිලි තහඩු බෙදාදීම තහනම් කර තිබේද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද;

(iv) එම තහනම ඉවත්කර, පෙර තිබූ පරිදි මන්ත්‍රීවරයන්ගේ මාර්ගයෙන් සෙවිලි තහඩු බෙදාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1478/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයඹ පළාතේ, මධ්‍යම රජය සහ පළාත් සභාව යටතේ පාලනය වන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් ස්ථිර විදුහල්පතිවරයන් සිටින පාසල් සංඛ්‍යාව සහ එම පාසල්වල නම් කවරේද;

(iii) දැනට වැඩබලන විදුහල්පතිවරයන් සිටින පාසල් සංඛ්‍යාව සහ එම පාසල්වල නම් කවරේද;

(iv) පසුගිය වසරේ පවත්වනු ලැබූ විදුහල්පතිවරයන් බඳවා ගැනීමේ තරඟ විභාගයෙන් වයඹ පළාතෙන් සමත් වූ සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(v) එම විභාගය සමත් වූ පිරිස දැනට නිවැරදිව සේවා ස්ථානගත කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1584/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හොරණ, පෝරුවදණ්ඩ, වගවත්ත, පර්ත් නව නිවාස සංකීර්ණයේ අංක 39 දරන ලිපිනයේ පදිංචි පී. සීතාදේවී මහත්මිය, හොරණ, පර්ත් වත්තේ ළමා උයන් පාලිකාව ලෙස සේවයට බැඳුනු දිනය කවරේද;

(ii) ඇය සේවයෙන් අස්වූ දිනය කවරේද;

(iii) වසර 26 ක සේවය අවසන් කිරීමේදී ඇයට ලැබිය යුතු වන්දි මුදල හා පාරිතෝෂික මුදල කොපමණද;

(iv) 2016.11.26 දින එම මුදල ලබාදීමට කම්කරු දෙපාර්තමේන්තුව විසින් නියම කර තිබේද;

(v) එසේ නම්, එම වන්දි හා පාරිතෝෂික මුදල් නොගෙවා සිටින්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1601/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය යල් පැන ගොස් ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ කාලීන සහ අනාගත අපේක්ෂාවන් සඳහා ගැලපෙන ජාතික බලශක්ති ප්‍රතිපත්තියක් අවශ්‍ය බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම නව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1603/'17

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ නගරයට විදුලිය සපයන ප්‍රධාන භූගත විදුලි සැපයුම් මාර්ගයක් වසර 03ක පමණ සිට අක්‍රීයව පවතින බව දන්නේද;

(ii) එම මාර්ගයේ විදුලි සැපයුම් ධාරිතාවය කොපමණද;

(iii) එකී සැපයුම් මාර්ගය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පියවර ගැනීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

(iv) එකී සැපයුම් මාර්ගය අලුත්වැඩියා කිරීම ප්‍රමාද වීම පිළිබඳව වගකිවයුතු නිලධාරීන් කවුරුන්ද;

(v) එම එක් එක් නිලධාරියාට එරෙහිව අමාත්‍යාංශය හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙතෙක් ගෙන ඇති විනයානුකූල පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) කොළඹ නගරයේ අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම සඳහා සම්ප්‍රේෂණ පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1633/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සතු බලශක්ති උත්පාදන මූලාශ්‍ර කවරේද;

(ii) එම එක් එක් බලශක්ති මූලාශ්‍රය මඟින් සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ලැබෙන වාර්ෂික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට සුනිත්‍ය බලශක්ති අරමුදල සතුව පවතින අරමුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම අරමුදල් තැන්පත් කර ඇති බැංකු/ මූල්‍ය ආයතන කවරේද;

(v) එකී අරමුදලෙන් අපේක්ෂිත අරමුණු සඳහා එය නිසි පරිදි භාවිතා වන බවට සෑහීමට පත්වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1711/'17

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක සිවිල් ආරක්ෂක කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් කලාපවලට අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂක නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම දිස්ත්‍රික්කයේ තෝරාගත් සිවිල් ආරක්ෂක කලාපවල සංගීත සංදර්ශන පැවැත්වූ බව දන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iii) එක් සිවිල් ආරක්ෂක සේවා නිලධාරියෙකු විසින් සංගීත සංදර්ශන ටිකට්පත් 20ක් අනිවාර්යෙන් අලෙවි කළ යුතු වූ බව දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1792/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ කටයුතු කරමින් සිටි මුස්ලිම් විවාහ රෙජිස්ටාර්වරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) එම විවාහ රෙජිස්ටාර් කොට්ඨාස මඟින් ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම රෙජිස්ටාර් කොට්ඨාස ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන තිබේද; අංක හා දින සභාගත කරන්නේද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 14 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

136/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනාන්තර වලින් අල්ලා නීති විරෝධී ලෙස ලඟ තබාගෙන සිටින හා 2009 වසරෙන් පසුව ව්‍යාජ ලෙස ලේඛන සකස් කර ලියාපදිංචි කළ අලි පැටවුන් පිළිබඳව පරීක්ෂා කර සකස් කළ විගණන විමසුම් වාර්තාව 2014.07.22 දින එවකට වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බවත්;

(ii) එම වාර්තාවට අදාළව ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධව දින 14ක් ඇතුළත දැන්විය යුතුව තිබූ බවත්;

(iii) දින 14ක් පිරීමට පෙර එම වාර්තාව සැකසූ නියෝජ්‍ය විගණකාධිපති ඒ.එච්.එම්.එල් අබන්වල මහතා එම කාර්යයෙන් ඉවත් කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාර්තාවට අනුව, අලි පැටවුන් ජාවාරම පිළිබඳ චෝදනා ලැබූ පුද්ගලයන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා තනතුරු යන තොරතුරු කවරේද;

(ii) මෙම පුද්ගලයන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග පිළිබඳව විගණකාධිපති දෙපාර්තමේන්තුවට දැනුම් දී තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) අදාළ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

976/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) වයඹ පළාතේ, හලාවත, ඉරණවිල ප්‍රදේශයේ "ඇමරිකන් හඬ" (Voice of America) යනුවෙන් සම්ප්‍රේෂණාගාරයක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම ලබා දී ඇත්තේ සින්නක්කරද; එසේ නැතහොත්, බදු පදනම මතද;

(iv) බදු පදනම මත නම්, ශ්‍රී ලංකා රජයට ලබාදී ඇති බදු ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මෙම භූමිය තුළ ශ්‍රී ලංකා රජයේ සියලුම නීති රීති බලාත්මකවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "ඇමරිකන් හඬ" ආයතනය ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රජය සහ ඇමරිකා එක්සත් ජනපද රජය හෝ "Voice of America" ආයතනය සමඟ එළඹී ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් සියල්ලම සභාගත කරන්නේද;

(iii) එම ආයතනය තුළ සේවය කරන ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතනය විසින් කරනු ලබන වැඩකටයුතු සහ විකාශනය කරනු ලබන වැඩසටහන් කවරේද;

(v) එම වැඩකටයුතු හා වැඩසටහන් නියාමනය කරනු ලබන රාජ්‍ය ආයතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1046/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පළාත් පාලන මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය පිළිබඳ අභියාචනා විභාගය අවසන් කරනු ලැබුවද පළාත් පාලන මැතිවරණ නීතියේ පවතින අඩුපාඩු හේතුවෙන් පළාත් පාලන මැතිවරණ පැවැත්වීමට නොහැකි බවට මැතිවරණ කොමිසම හෝ එහි පූර්වගාමී මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දී තිබේද;

(ii) එසේ නම්, එම අඩුපාඩු කවරේද;

(iii) එකී අඩුපාඩු අතරින් මැතිවරණය පැවැත්විය නොහැකි මට්ටමේ අඩුපාඩු තිබේ නම්, ඒවා කවරේද;

(iv) එකී අඩුපාඩු මැතිවරණ කොමිසම හෝ එහි පූර්වගාමී මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ලිඛිතව දැනුම් දුන් දිනය කවරේද;

(v) එකී අඩුපාඩු සැකසීමට මෙතෙක් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1116/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2010 සිට 2016 වර්ෂය දක්වා බණ්ඩාරවෙල නගර සභාවට,

(i) පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය;

(ii) පළාත් සභාව මඟින් ලබා දුන් මුදල් ප්‍රමාණය;

වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2010 සිට 2016 වර්ෂය දක්වා පළාත් පාලන අමාත්‍යාංශය හා ඌව පළාත් සභාව මඟින් බදුල්ල දිස්ත්‍රික්කයේ වෙනත් පළාත් පාලන ආයතන සඳහා ලබා දුන් මුදල් ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1171/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික්කයේ, සමන්තුරේහි පැවති "දැයට කිරුළ" ප්‍රදර්ශනය සඳහා පැමිණි ආරාධිතයන්ට ආරක්ෂාව සැලසීම සහ වාහන නවතා තැබීම පිණිස වලතාපිටිය ප්‍රදේශවාසීන්ගේ කුඹුරු ඉඩම් ආරක්ෂක හමුදා විසින් තාවකාලිකව පවරාගත් බවත්;

(ii) මෙම ඉඩම් පාවිච්චි කිරීම වෙනුවෙන් කිසිදු ගෙවීමක් සිදුකර නොමැති බවත්;

(iii) දැනට හිස්ව පවතින මෙම ඉඩම්වල වගා කිරීමට ඉඩම් අයිතිකරුවන් උත්සාහ කළද, ඒ සඳහා හමුදා නිලධාරීන් ඉඩ ලබා නොදෙන බවත්;

(iv) එම ඉඩම්, අයිතිකරුවන්ට ලබාදීමට මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඉඩම් යළි අයිතිකරුවන්ට ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1192/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1983 වර්ෂය වනවිට මන්නාරම දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුද්ධමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1362/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් ගෙවීම සඳහා ලියාපදිංචි වී ඇති මාතර දිස්ත්‍රික්කයේ පෞද්ගලික ආයතන සංඛ්‍යාව කවරේද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලේ සාමාජිකත්වය ලබා ඇති මාතර දිස්ත්‍රික්කයේ සේවක සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල සඳහා ලියාපදිංචි වීමට පැවතිය යුතු අවම අවශ්‍යතාවයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1383/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 147 අනුව, මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 50/= දක්වා වැඩි කිරීමෙන්, රාජ්‍ය අය භාරයට වූ දායකත්වය කවරේද;

(ii) 1977 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය සහ එහි ආනයන වටිනාකම එක් එක් වර්ෂය අනුව කවරේද;

(iii) රේගු දත්ත අනුව, ශ්‍රී ලංකාවට මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය කරනු ලබන ආනයනකරුවන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) ශ්‍රී ලංකාවට මාළු ආනයනය කිරීම අඩු කිරීම සඳහා රජයට කිසියම් වැඩ පිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1494/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මඟින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7(25) වගන්තිය අනුව 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ හෝ යම් පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන යම් සමූපකාර සමිතියක ලාභ සහ ආදායම් 2011 අප්‍රේල් 01 දින සිට ආදායම් බද්දෙන් නිදහස් කර ඇති බව පිළිගන්නේද;

(ii) එයට අමතරව එම සමූපකාර සමිතිවල පොලී හා ලාභාංශද ආදායම් බද්දෙන් නිදහස් කර ඇති බව දන්නේද;

(iii) මීට අමතරව, දේශීය ආදායම් පනතේ 133 (3) (අ) වගන්තිය අනුව එම සමූපකාර සමිතිවල පොලී ආදායම් රඳවා ගැනීමේ බද්දෙන්ද නිදහස් කර ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කරුණු හේතුවෙන් සමූපකාර සමිතිවලට විශාල වාසි සහගත තත්ත්වයක් ඇතිවූ බව පිළිගන්නේද;

(ii) කරුණු එසේ තිබියදී 2017 අයවැයෙන් එම බදු නිදහස අහෝසි කර ඇති බව දන්නේද;

(iii) මෙසේ අහෝසි කරන ලද සියලුම පහසුකම් නැවත සමූපකාර සමිතිවලට ලබාදෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1593/’17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා වයඹ පළාත් සභාව මඟින් අළුතින් ආරම්භ කළ පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1602/’17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇන්ටේ ලෙකෝ ප්‍රයිවට් ලිමිටඩ් (Ante Leco (pvt) Ltd.) ආයතනය පිළිබඳ රජයට ඇති අයිතිය කවරේද;

(ii) එම ආයතනය ආරම්භ කරන ලද අරමුණ කවරේද;

(iii) එම සමාගම විසින් නිෂ්පාදනය කර ඇති විදුලි මීටර් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සමාගමේ සේවක සංඛ්‍යාව කොපමණද;

(v) ආරම්භයේ සිට එම සමාගම ලබා ඇති ලාභය හෝ පාඩුව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1604/’17

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,—විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ලංකා විදුලිබල මණ්ඩලයට සැපයීම සඳහා විදුලිය උත්පාදනය කරනු ලබන විදුලි බලාගාර කවරේද;

(ii) එම එක් එක් බලාගාරයේ විදුලි උත්පාදන ධාරිතාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් බලාගාරයෙන් විමෝචනය වන පරිසරයට හානිකර වායූ පිළිබඳ තක්සේරුවක් කර තිබේද;

(iv) පරිසර හිතකාමී ක්‍රමවේද භාවිතා කිරීම මඟින් කොළඹ නගරය ඇතුළු බස්නාහිර පළාතට විදුලිය ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1793/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ කටයුතු කරමින් සිටි මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) එම විවාහ රෙජිස්ට්‍රාර් කොට්ඨාස මඟින් ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම රෙජිස්ට්‍රාර් කොට්ඨාස ප්‍රකාශයට පත්කරන ලද ගැසට් පත්‍ර අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1856/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වසරේ සිට ඉදිරි වසර 03 ක් දක්වා කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, එම ආයෝජන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1954/'17

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත ශ්‍රී ලංගම ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් අඩු කිරීමට බලාපොරොත්තු වන ශ්‍රී ලංගම ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝ සංඛ්‍යාව ප්‍රාදේශීය මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) යෝජිත ප්‍රතිව්‍යුහගත ක්‍රමය තුළින් දැනට සාර්ථක ප්‍රවාහන සේවාවක් සපයනු ලබන සහ ඉඩ පහසුකම්වලින් යුත් ඩිපෝ සංඛ්‍යාවක් වැසී යන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, යෝජිත ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පෙර ඒ පිළිබඳව යළි සළකා බැලීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 15 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

138/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව සකස් කිරීමට පත් කරන ලද විද්වත් කමිටුවේ සාමාජිකයින් කවුරුන්ද;

(ii) එම කමිටුව පත් කළ දිනය කවරේද;

(iii) එම කමිටුව මෙම ව්‍යවස්ථාව සකස් කර අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව සම්මත කිරීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

(iii) නොඑසේ නම්, විගණන සේවා ව්‍යවස්ථාව සම්මත කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයකදීද;

(v) මෙම සේවා ව්‍යවස්ථාව සම්මත කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1072/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මුදල් අමාත්‍යාංශය විසින් බදු ගෙවීම පිළිබඳව 2016 සැප්තැම්බර් මාසයේදී මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචාරය කරනු ලැබූ දැන්වීම් ප්‍රචාරය කිරීම ආරම්භ කළ දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත දැන්වීම්,

(i) ප්‍රචාරය නැවැත්වූ දිනය කවරේද;

(ii) ප්‍රචාරය කිරීම සඳහා එක් එක් මාධ්‍ය ආයතනයට ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් සහ සමස්තයක් වශයෙන් කොපමණද;

(iii) පළකිරීම සඳහා වෙන් කළ මුදල මාධ්‍ය ආයතන අතර බෙදීමට යොදා ගත් පදනම කවරේද;

(iv) පළකිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා දුන් රාජ්‍ය ආයතන සහ එක් එක් ආයතනය විසින් දක්වන ලද දායකත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) පළකිරීම සඳහා අමාත්‍යාංශ මුදල් වැය කලේ නම්, ඒ සඳහා යොදා ගත් වැය ශීර්ෂ කවරේද;

(vi) පළ කිරීමට යොදා ගත් දැන්වීම් නියෝජිතායතන සහ එක් එක් ආයතනයට ලබා දුන් කොමිස් සහ ගාස්තු මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) එකී ප්‍රචාරක නියෝජිතායතන තෝරා ගත් පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1117/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක දිවිනැගුම ප්‍රජා මූල බැංකු (සමෘද්ධි බැංකු) සංඛ්‍යාව කොපමණද;

(ii) එම බැංකු පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එක් එක් බැංකු ශාඛාවෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් එක් එක් බැංකුවක සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දැනට එම බැංකුවල සේවක පුරප්පාඩු තිබේද;

(iii) එසේ නම්, එම පුරප්පාඩු සඳහා සේවකයන් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1197/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) යාපනය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1411/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 179 යෝජනාවට අනුව, ආනයනය කරනු ලැබූ ස්වර්ණාභරණ සඳහා පැනවූ 10%ක සෙස් බද්ද මඟින් රැස්කළ මුළු බදු ආදායම කොපමණද;

(ii) එකී සෙස් බද්ද දේශීය ශිල්පීන් සුරැකීම සඳහා යොදාගත් ආකාරය කවරේද;

(iii) වර්ෂ 1977 සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ස්වර්ණාභරණවල වටිනාකම සහ ප්‍රධාන ආනයනකරුවන් 20 දෙනාගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) ශ්‍රී ලංකාවට ස්වර්ණාභරණ ආනයනය කරන්නේ නම්, ඒවායේ ප්‍රධාන සැපයුම්කරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1495/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාන්ඔය ව්‍යාපෘතිය සඳහා අවට පදිංචි ප්‍රදේශවාසීන්ගේ ඉඩම් අත්කර ගැනීම හේතුවෙන් පාරම්පරික වැව් 07 ක්, ගේදොර සහ කුඹුරු මෙම ජලාශයට යටවීම නිසා එම පිරිස ඉඳුම් හිටුම් නොමැතිව අසරණ තත්ත්වයට පත්වී ඇති බවත්;

(ii) ප්‍රදේශවාසීන්ගේ විරෝධය නොතකා ජන ජීවිතයට නුසුදුසු කජුවත්ත ප්‍රදේශයේ විශාල ඝන වනාන්තරයක් ඔවුන්හට බෙදා දීමට නිලධාරීන් විසින් කටයුතු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ප්‍රදේශවාසීන් විසින් මල්පෝරුව ගම්මානය අසල, දකුණු ඇළට යාබදව, ජලාශයට යටනොවූ ඉඩම් අක්කර 600ක ප්‍රමාණයෙන් අක්කර 200ක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි බවත්;

(ii) ඒ අනුව, විෂය භාර අමාත්‍යවරයා අදාළ නිලධාරීන් සමඟ පැමිණ ඉහත කී ඉඩමෙන් අක්කර 200ක ගොඩ ඉඩම් හැකි ඉක්මනින් එම ජනතාවට ලබාදෙන ලෙස ඔවුන්ට උපදෙස් දුන් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ වුවද, මේ දක්වා ඔවුන්ට පදිංචිය සඳහා ඉඩම් නොලැබී ඇති බැවින්, ඉහත ආ (ii) හි තීරණය අනුව වහාම ඉඩම් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1605/'17

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෙරවලපිටිය ප්‍රදේශයේ ඉදිකර ඇති බර ඉන්ධන (HFO) මඟින් දැනට ක්‍රියාත්මක වන බලාගාරය වසරක කාලයක් තුළ ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) මඟින් ක්‍රියාත්මක කරවීම සඳහා එකඟතාවයක් තිබුණේද;

(ii) එම එකඟතාවය කඩ වී තිබේද;

(iii) එම එකඟතාවය කඩවීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවී ඇති අලාභය කොපමණද;

(iv) එකී බලාගාරය මඟින් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දෙන විදුලි ඒකකයක මිල නියම කිරීමට අදාළව ඇතිකර ගන්නා ලද එකඟතාවයන්ට පටහැනිව කටයුතු සිදුවන බව දන්නේද;

(v) ගිවිසුම් ප්‍රකාරව විදුලි සැපයුම්කාර සමාගම ක්‍රියා කිරීම තහවුරු කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(vi) එම එකඟතාවය පරිදි කටයුතු නොකිරීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වී ඇති පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1781/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ ආඥාපනත අනුව, යම් භූමියක් රක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමට සම්පූර්ණ විය යුතු මූලික අවශ්‍යතා කවරේද;

(ii) වන සංරක්ෂණ ආඥාපනත යටතේ මේ දක්වා ප්‍රකාශයට පත් කර ඇති රක්ෂිත වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් රක්ෂිත වනාන්තර ප්‍රකාශයට පත් කළ දිනය, එයට ඇතුළත් කර ඇති භූමි ප්‍රමාණය හා අදාළ සිතියම් පිළිබඳව සියලු විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1814/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යා හා ගණිත විෂය ධාරාවන් පැවැත්වෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විෂය ධාරාවල එක් එක් විෂය සඳහා, අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව, දැනට සිටින ගුරුවරුන් සංඛ්‍යාව සහ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා විෂය ධාරාවන් සඳහා ගුරුවරුන් හිඟවීමට බලපා ඇති හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1842/'17

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩිසුඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති උළු කර්මාන්තශාලාව ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(ii) මෙම කර්මාන්තශාලාව සඳහා 2016 වර්ෂයේ අයවැයෙන් වෙන් කළ මුදල් ප්‍රතිපාදනය කොපමණද;

(iii) එම මුදල වියදම් කරනු ලැබුවේ කවුරුන් හරහාද;

(iv) එම වෙන් කරන ලද මුදලින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1857/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වසරේ සිට ඉදිරි වසර 03 ක් දක්වා දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, එම ආයෝජන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණයත් කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1874/'17

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති වූ දැඩි ගංවතුර තත්ත්වය හේතුවෙන් කින්නියා ප්‍රදේශයේ කුරින්ජක්කේනි පාලම විනාශ වූ බවත්;

(ii) මේ දක්වා එම පාලම සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය නොකර තාවකාලිකව ප්‍රතිසංස්කරණය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දෛනිකව විශාල ජනතාවක් විසින් භාවිතා කරනු ලබන මෙම පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ගනු ලැබූ පියවර කවරේද;

(ii) මේ දක්වා මෙම පාලම ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

(iii) මෙම පාලම හැකි ඉක්මනින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1876/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩප්පුව ප්‍රදේශයේ වෙරළ තීරය දැඩි ඛාදනයට ලක්වී තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම ඛාදනය නිසා පීඩාවට ලක්වී සිටින ධීවර පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වෙරළ තීරය මුහුදු ඛාදනයෙන් ආරක්ෂා කිරීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1960/'17

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2017 මැයි මස 26 දින සිට ජූනි මස 05 දින දක්වා ඇතිවූ ගංවතුර හා නායයාම් හේතුවෙන්,

(i) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් ලබාදෙන වන්දි මුදල;

(ii) සම්පූර්ණයෙන් හා අර්ධ වශයෙන් හානිවූ නිවාස සඳහා ලබාදෙන වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිවාස ගංවතුරින් යටවීම හේතුවෙන් සියලු දේපල අහිමි වූ නිවෙස් හිමියන් සඳහා ලබාදෙන වන්දි මුදල කොපමණද;

(iv) එම වන්දි මුදල් ලබාදීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1964/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමානයේ කුකුළු කර්මාන්තයේ නිරත වී සිටින සමහර ගොවිපළ හිමියන් "බැටරි කේජ්" නමින් නව ක්‍රමයට කුකුළන් ඇති කරන බව දන්නේද;

(ii) එම ක්‍රමය මඟින් කුකුළන් දැඩි හිංසාවකට ලක්වන බව පිළිගන්නේද;

(iii) මෙම ක්‍රමය තහනම් කිරීම සඳහා පියවර ගන්නේද;

(iv) මෙම ක්‍රමය තුළින් දේශීය වෙළඳපළට අධික බිත්තර සැපයුමක් ඇති වන බැවින්, බිත්තර මිල පහත වැටීමේ අවදානමක් මතුවන බව පිළිගන්නේද;

(v) එසේ නම්, දේශීය බිත්තර නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමට හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 196/'17

ගරු වජිරි වජිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය හා සබැඳි ගැටලු පිළිබඳ සොයා බලා වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

කඳුරට නැගෙනහිර බෑවුමෙහි උමා ඔය මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාවක් වන හෙයින්ද;

උමා ඔයේ ජල සම්පත් බහුකාර්ය සංවර්ධන වැඩසටහන සඳහා උපයෝගී කර ගැනීම සහ එහි ජලය කිරිඳි ඔය වෙත හරවා යැවීම සඳහා ද මහවැලි සංවර්ධන වැඩසටහනෙහි සැලසුම්කරණ අවදියේදී සැලසුම් සකස් කොට තිබූ හෙයින්ද;

2007 වර්ෂය තුළ මෙම යෝජනා අත්හිටුවා තිබූ අතර 2007 නොවැම්බර් 27 වැනි දින උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකරනු පිණිස ශ්‍රී ලංකාවේ එවකට ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා හා ඉරානයේ බලශක්ති අමාත්‍යවරයා අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබූ හෙයින්ද;

මෙම අවබෝධතා ගිවිසුම යටතේ, ඉරාන ඉස්ලාමික ජනරජය (GIRI) එම රජය මෙන්ම, ශ්‍රී ලංකා රජය විසින්ද පිළිගනු ලැබූ කොන්ත්‍රාත්කරු වන ෆරාබ් සමාගමට (Farab Company) දැනට තිබෙන ශක්‍යතා අධ්‍යයනය යාවත්කාලීන කොට ව්‍යාපෘතියේ භෞතික ඉදිකිරීම් සිදු කිරීමටත්, "මූල්‍ය සම්පාදක" වශයෙන් ඉරාන අපනයන සංවර්ධන බැංකුව (EDBI) සමඟ උචිත සංවිධිවිධාන යෙදීමටත් බලය පවරා තිබූ හෙයින්ද;

මෙම අවබෝධතා ගිවිසුමට ආනුෂංගිකව උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2008 අප්‍රේල් 28 වැනි දින ශ්‍රී ලංකාවේ වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය සහ ඉරානයේ ෆරාබ් එනර්ජි ඇන්ඩ් වෝටර් ප්‍රොජෙක්ට්ස් නමැති සමාගම අතර කොන්ත්‍රාත් ගිවිසුමක් ඇති කර ගනු ලැබූ හෙයින්ද;

(අ) කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කරන කාලසීමාව තුළදී පාර්ශ්වයන් විසින් එකඟ වන පරිදි විශේෂිත කොන්දේසි සංශෝධනය කිරීමට,

(ආ) කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කරන කාලසීමාව තුළදී පාර්ශවයන් විසින් එකඟ වන පරිදි තාක්ෂණික පිරිවිතරයන්/සේවායෝජක අවශ්‍යතා සංශෝධනය කිරීමට,

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන සාකච්ඡා කමිටුවක් (Cabinet Appointed Negotiation Committee) විසින් මිල ගණන් සහ ගෙවීම් ක්‍රමවේදය සාකච්ඡා කිරීමට සහ සම්පූර්ණ කොන්ත්‍රාත් මිල සහ ගෙවීම් ක්‍රමවේදය තීරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට,

කොන්ත්‍රාත් ගිවිසුම යටතේ විධිවිධාන සකස් කොට ඇති හෙයින්ද;

(i) කොන්ත්‍රාත් මිල ලෙස ඇ. ඩො. 514,059,198ක් සහ ගෙවීමේ ක්‍රමවේදය පිළිබඳ සාකච්ඡාවලින් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන සාකච්ඡා කමිටුව විසින් කරන ලද නිර්දේශ භාර ගැනීමට,

(ii) කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම ඇ. ඩො. 529,059,198ක් වන ලෙස සකස් කිරීමට යෝජනා කොට ඇති ඇ. ඩො. 15,000,000ක අවිනිශ්චිතතා මුදලක් ඇතුළත් කිරීමට;

(iii) සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යනයෙන් අනතුරුව වැඩ විෂය පථය තුළ යම් අඩුකිරීමක් හේතුවෙන් ඉතිරියක් ඇති වුවහොත්, එම ඉතිරිය අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් නිර්දේශ කොට ඇති පහත දැක්වෙන කාර්යයන් සඳහා භාවිතා කිරීමට;

(අ) ගඟ පහල සංවර්ධන (වාරිමාර්ග) කටයුතු,

(ආ) ඉහළ ජලපෝෂක ප්‍රදේශය සංරක්ෂණය කිරීම,

(ඇ) ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කරවීම,

(ඈ) පරිසර අධ්‍යයනය,

(ඉ) නගර සංවර්ධනය.

(iv) අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව (CANC) සහ ෆරාබ් සමාගම විසින් එළැඹි ඉහත ගිවිසුම මත පදනම්ව වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය සහ ෆරාබ් සමාගම විසින් කොන්ත්‍රාත්තුව සඳහා පරිපූරකයක් අත්සන් කිරීමටද;

2008.12.08 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් 2008 දෙසැම්බර් 18 වැනි දින අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබාදෙන ලද හෙයින්ද;

ඒ අනුව, එවකට වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ෆරාබ් සමාගම විසින් 2009 පෙබරවාරි 22 වැනි දින කොන්ත්‍රාත් ගිවිසුමේ 1 වන පරිපූරකය අත්සන් කරන ලද හෙයින්ද;

2009 පෙබරවාරි 22 වැනි දින අත්සන් තබනු ලැබූ එකඟතා ගිවිසුම මඟින් සාදන ලද කොන්ත්‍රාත් ගිවිසුමේ පරිපූරක අංක 1 හි, අනෙකුත් කරුණු අතර ව්‍යාපෘති පිරිවැය ඇ.ඩො. 529,059,198 ක් ලෙස සංශෝධනය කර ඇති අතර, භෞතික අවිනිශ්චිත අවස්ථා සඳහා ඇ.ඩො. මිලියන 15ක් ද ඊට අයත් වන අතර ඒ අනුව කොන්ත්‍රාත් වටිනාකම ඇ.ඩො. මිලියන 514 ක් ඇති හෙයින්ද;

පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සමාලෝචනය කිරීම පිණිස විවිධ නියෝජිතායතනවල කාර්ය මණ්ඩලවල සහ විෂය ක්ෂෙත්‍රයන්හි විශේෂඥයන්ගෙන් සමන්විත කණ්ඩායමක් ද පත්කර තිබූ හෙයින්ද;

(අ) මොණරාගල දිස්ත්‍රික්කයේ නව ඉඩම් හෙක්ටයාර 4500කට පමණ සහ දැනට වගාකරනු ලබන කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 1500කට පමණ වගා කිරීම සඳහා ජලය සැපයීමට,

(ආ) මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පානීය සහ කර්මාන්ත ජල අවශ්‍යතා සඳහා ජලය ඝන මීටර මිලියන 30ක් සැපයීමට,

(ඇ) මෙගාවොට් 120ක ස්ථාපිත ධාරිතාවය සහිත භූගත විදුලි බලාගාරයක් හරහා ජාතික පද්ධතියට වාර්ෂිකව ගිගාවොට් පැය 231 ක විදුලි බල ශක්තියක් උත්පාදනය සහ සැපයීමට,

(ඈ) ඩයරාබා ජලාශයෙන් මහා බණ්ඩාරවෙල නගරාශ්‍රිත ප්‍රදේශ සඳහා ජල යෝජනා ක්‍රමය, පුහුල්පොල ජලාශයෙන් ඇටම්පිටිය ජල යෝජනා ක්‍රමය සහ කුඩා ඔය ජලාශයෙන් හම්බේගමුව ජල යෝජනා ක්‍රමය සඳහා ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයට පානීය ජල අවශ්‍යතා සැපයීමට,

මේ වනවිට ආසන්න වශයෙන් සියයට 40 ක පමණ වැඩ අවසන් කර ඇති හෙයින්ද;

ඉන් අනතුරුව 2014 දෙසැම්බර් මාසයේදි  බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මකුල් ඇල්ල වෙහෙරගලතැන්න, උඩ පේරුව, බඹරගම සහ හීල් ඔය ප්‍රදේශවල ගෘහස්ථ ළිංවල ජල මට්ටම අඩුවීම, ස්වභාවික ජල උල්පත් සිඳීයාම සහ නිවාසවල බිත්ති  සහ පොළොවෙහි සහ භූමියෙහි ඉරිතැලීම් ඇතිවීම්  වාර්තා වූ හෙයින්ද;

අනතුරුව 2017 අප්‍රේල් මාසයේදී එරනවිල සහ අත්තලපිටිය ග්‍රාම නිලධාරී වසම්වල සහ පසුව තන්තිරිය ග්‍රාම නිලධාරී වසමේ ද එම තත්ත්වය වාර්තා වූ හෙයින්ද;

මෙම තත්ත්වය හමුවේ මෙම ව්‍යාපෘතියේ ආරම්භය සහ ගැටලු පිළිබඳ පහත කරුණු සළකා බැලිය යුතු හෙයින්ද;

(අ) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පූර්වයෙන් නිසි සහ විස්තීරණ ශක්‍යතා අධ්‍යයනයන් සිදුකරනු ලැබුයේද,

(ආ) ව්‍යාපෘතිය සඳහා නිම් යථාර්තවාදී පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කරනු ලැබුයේද,

(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී යථාරූපී නොවූ පිරිවැය සීමා ඉක්මවා යාම් සිදුවූයේද,

(ඈ) විස්තීරණ පාරිසරික බලපෑම් ඇගයීමක් සිදු කරනු ලැබුයේද;

යන වග මෙන්ම,

(අ) ඉහතින් සඳහන් කරන ලද වාර්තා පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වූ පුද්ගලයන්,

(ආ) එකී වාර්තා පිළියෙල කිරීම සම්බන්ධයෙන් එම පුද්ගලයා හෝ පුද්ගලයන් නොසැලකිලිමත් අයුරින් කටයුතු කොට තිබේද,

(ඇ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී කවර හෝ වංචාකාරී හෝ අපරාධ ක්‍රියාකාරකමක් සිදුවීම සම්බන්ධයෙන් කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් වරදකරුවන් බවට පත්වී තිබෙනුයේ ද, යන්න සහ එසේ සිදු වී ඇත්නම්, එම පුද්ගලයන් කවුරුන්ද යන වග,

(ඈ)ව්‍යාපෘතියේ අහිතකර බලපෑම් සම්බන්ධයෙන් කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් හෝ ආයතන වගකිව යුතු වූයේද යන්න සහ එසේ වූයේ නම්, ඒ කවුරුන්ද යන වග,

(ඉ) මෙම ව්‍යාපෘතිය මඟින් අහිතකර බලපෑම්වලට ලක් වූ පුද්ගලයන් සඳහා යම් වන්දියක් ප්‍රදානය කිරීමට නියමිතව පවතීද යන්න තීරණය කිරීමටත්,

(ඊ) තමන් සිදුකරන විමසීම් කටයුතු සඳහා අදාළ වෙතැයි කාරක සභාවට හැඟෙන වෙනත් කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් විමසීමට සහ වාර්තා කිරීම සඳහා ද,

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුනද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරනය නියමකර ගැනීමටත්;

(ආ) යම් පුද්ගලයින් කැඳවීමට, ලිපි ලේඛනාදිය සහ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව ඉදිරියේ හෝ එවන් කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස කවර හෝ පුද්ගලයකුට නියම කිරීමට සහ එවන් පුද්ගලයකුගේ සන්තකය හෝ පාලනය යටතේ පවතින කවර හෝ පත්‍රයන්, ග්‍රන්ථමය වාර්තාවක් හෝ ලිපිලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමටත්;

(ඇ) සාක්ෂිකරුවන්ගේ වාචික සාක්ෂි ලබාගැනීම මඟින් කරුණුවල සත්‍ය අසත්‍යභාවය පරීක්ෂාකර බැලීමටත්, සහතික කරගැනීමටත් සහ කාරක සභාවේ සභාපති විසින් හෝ මේ සඳහා විශේෂ අවසරය සලසා ඇති පුද්ගලයකු විසින් සිදුකරනු ලබන දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මඟින් සාක්ෂිකරුවන් පරීක්ෂාවට ලක්කිරීමටත්;

(ඈ) කාරක සභාවේ සහය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමටත්; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමටත්;

බලය තිබිය යුත්තේය.

4. කාරක සභාව සිය පළමු රැස්වීම් පැවැත්වීමේ සිට මාස හයක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙනු ලබන වෙනත් හෝ වැඩිදුර කාලයක් ඇතුළත සිය වාර්තාව සකස් කළ යුත්තේය.